කොවිඩ්-19 තත්වය සහ කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී තමන් භාවිතා කරනා භාෂාව පිළිබඳවද මාධ්‍ය විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු වේ. ඊට හේතුව වන්නේ, වැරදි ආකාරයෙන් කොවිඩ්-19 ආසාදිතයන් හැඳින්වීම සඳහා භාවිතා කරනා යෙදුම් ඔස්සේ ඔවුන් කොන් කිරීමකට ලක් වීම, සමාජය තුළ ඔවුන් සම්බන්ධයෙන් ගර්හාවක් ඇති වීම වැනි ගැටළු ඇතිවීමේ හැකියාවයි.

ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් සහ වෙනත් පාර්ශවයන් මගින් මීට අදාළව හඳුන්වා දී ඇති මාර්ගෝපදේශන මාලාව තුළ, කොවිඩ්-19 ආසාදිතයින් පිළිබඳව වාර්තා කිරීමේදී "Covid-19 cases" හෝ "covid-19 victims" යනුවෙන් සඳහන් කිරීමෙන් වළකින ලෙසත්, ඒ වෙනුවට "people who have Covid-19", "people who are being treated for Covid-19", "people who are recovering from Covid-19", "people who died after contracting Covid-19" වැනි යෙදුම් භාවිතා කරන ලෙසටත් උපදෙස් දී තිබේ.

පහත දැක්වෙන්නේ DailyFT සහ Dailymirror පුවත්පත් තුළ කොවිඩ්-19 සම්බන්ධයෙන් පළවූ පුවත් වාර්තාවන්හි එම අයෝග්‍ය යෙදුම් භාවිතා වී ඇති ආකාරයයි.

අවසාන වශයෙන්, කොවිඩ්-19 සම්බන්ධ පුවත් වාර්තාවන් තුළ යොදාගන්නා භාෂාව සම්බන්ධයෙන් වැඩි ප්‍රවේසමක් සහ ආචාර ධාර්මික බවක් යොදාගන්නා ලෙසින් අපි නැවතත් සිහිපත් කරමු.

මේ සම්බන්ධයෙන් මින් පෙර අප පළ කළ වීඩියෝවට ප්‍රවේශය: https://www.facebook.com/ethicseye/posts/1293549284333459

#MediaEthicsSL #lka #EnglishPress #DailyFT#DailyMirror